අවසන් දිනය- 2026.02.26

# ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## පුරප්පාඩු

(පෙර දැන්වීම සංශෝධනය කිරීම කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2026 පරිදි)

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අවලංගු කරමින් 2026.02.02 දින ප්‍රකාශයට පත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 හි විධිවිධාන අනුව, 2026.01.28 දින දිණමිණ, තිනකරන්, සිලෝන් ඩේලි නිවුස් පුවත්පත් වල පළ කරන ලද පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ අවසාන දිනය 2026.02.26 දක්වා දීර්ඝ කර ඇත.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 – A කාණ්ඩයට අනුව වැටුප් කාණ්ඩය

| **ව්‍යාපෘති වටිනාකම (ඇ.ඩො. මිලියන)** | **ව්‍යාපෘතියේ නම** | **තනතුරු නාමය** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ එයට සමාන කාණ්ඩය | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - තුන්වන අදියර (CEP III) | ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| | වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය (PAEHP) | ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |

**<u>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026හි ඇමුණුම 01 ප්‍රකාරව තනතුරේ මූලික සුදුසුකම් පහතින් සඳහන් කර ඇත</u>**

ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ (කාණ්ඩය A) සඳහා අවශ්‍ය සුදුසුකම්

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [පහත (01) හෝ (02)]**

01. අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති) සුදුසුකමක් සහ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය

සමඟ

එම සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද. ඉන් වසර 8ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය.

02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික/ අධි සාමාජිකත්වය (Fellow Membership)

සමඟ

එම සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13ක පළපුරුද්ද. ඉන් වසර 7ක් ජ්‍යෝෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය.

---

සටහන -

- **අදාළ ක්ෂේත්‍රය යන්නෙන් අදහස් වන්නේ "සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය" වන අතර, පළපුරුද්ද ද එම ක්ෂේත්‍රයේ ම පැවතිය යුතු ය.**

---

**සාමාන්‍ය කොන්දේසි :**

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2026.02.02 දිනැතිව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2026 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- තෝරාගනු ලැබුවහොත් අපේක්ෂකයින් දිවයිනේ සහ/හෝ ප්‍රදේශයේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

**01. වයස් සීමාව:**

- පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවය/ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් සඳහා වයස 60ට අඩු
- අනෙකුත් අයදුම්කරුවන් සඳහා වයස 64ට අඩු

**02 වැටුප:**

- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.

- පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවය/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.

- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ අයදුම් පත සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.

- සේවා දිගු ලබා දීමේ සහ පත්වීම් ප්‍රදානය කිරීමේ තීරණය, චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවය/ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ පදනමේ නිර්දේශය ද සහිතව සිය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ).

**05. අයදුම්පත යොමු කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, මූලික උපාධියේ සවිස්තරාත්මක උපාධි සහතිකය (transcript), සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද සමග 2026.02.26 දිනට හෝ එදිනට පෙර **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට <u>ලියාපදිංචි තැපෑලෙන්</u> හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට <u>අතින් ගෙනවිත් භාර දිය හැකි ය</u>. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න.

**06. විශේෂ අවධානය සඳහා**

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි.**
- **2026.01.28 දින ප්‍රකාශයට පත් කරන ලද නිවේදනයට අනුව අයදුම්පත් දැනටමත් යොමු කර ඇති අයදුම්කරුවන්, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 හි සුදුසුකම් සපුරා ඇත්නම්, නව අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.**

**07. වැඩිදුර විමසීම් සඳහා**

0112271048

**08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් ප්‍රකාශයට පත් කරන ලද මෙම දැන්වීමේ භාෂා වාක්‍ය ඛණ්ඩ අතර කිසියම් නොගැලපීමක් තිබේ නම්, සිංහල දැන්වීමේ ඇති කරුණු බලපැවැත්විය යුතුය.**

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම 01

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**